සොයුරියකගේ හඳින් ලියැවෙ පිළිතුරක්

සන්නස 2005 ජූනි කළාපය අහම්බෙන් මා.තට පත්වුණේ දැනට දවස් කීපයකට උඩදීයි. අකුරෙන් අකුර පිටුවක් නෑර කියවද්දී සොයුරියකගේ හදින් ලිපියත් කියවන්න ලැබුණා. ඇත්ටම ඒ වගේ අත්දැකීමක් මමත් ලබලා තියෙන නිසා එක මවක දැනුවත් වෙනැයි යන බලාපොරොත්තුවෙන් මෙය ලියා එවන්න හිතුවා.

ගෘහ නිර්මාණ සැළසුම් ශිල්පිණියක ලෙසින් සේවය කළ මගේ කාර්යාලය තිබුණේ මීගමුව හරවලයේ සිට කිලෝ මීටර් 2.5ක් පමණ දුරින් නිසා දිනපතාම උදෑසන මීගමුව ප්‍රධාන බස් නැවතුමට පැමිණීමට සිදුවුණා. ඒ මට මඟක වීදිහරව 2004 වසර අග භාගයේදීයි. බස් නැවතුම්පළ ඉදිරියේ පාරෙන් අතික් පස තිබුණේ උසස් අධ්‍යාපන ආයතනයක්. ටියුෂන් පන්ති පවත් වන්නට පෙර බස් නැවතුම් පළ සිසු සිසුවියන්ගෙන් පිරී පැවතීම සුළබ දසුනක්. මේ ළමුන් රංචු වශයෙන් ඔවුනොවුන්ගේ කතා බහක. අධ්‍යපනික සාකච්ඡා, විහිළු තහළු, ඔවුනට බාදා කරන්න කවුරුත් නැහැ. මොකද උදෑසන බස් නැවතුම්පළ යන්තු වලින් නෙවෙයි යන්තු වශේදුවන මිනිසුන්ගෙන් පිරිලා. මමත් බසයක් බලාපොරොත්තුවෙන් යෙහෙළියක සමග පෝලිමකට එකතු වෙලා හිටියෙය.
සියල්ලන්ගේම කතා බහ අඩිබවා මතුවුණේ සැර පරුෂ ගැහැණු කටහඬක්. හැමඑකම කතා නැවතිලා. ඒ දිහාවට කර පෙව්වත් පුද්ගලයා පෙණුනෙ නෑ. ඒ තරමට සෙනග කෑ ගැහීම ඇහුණ ප්‍රත්පට රොක් වෙලා. ළමයින්ගෙන් වැඩිහිටි පිරිසගෙන් ඔළ ගෙඩි අතරින් පෙනුණෙ හිස් අවකාශයක්. ඒ අතරට අපිත් කර පොවලා බැළුවා. හැමඑදේකටම ඔළුව දානා ගමන ගතිය හින්දා නෙවේ, දෙනෝ දාහක් ගැවසෙන ප්‍රසිද්ධ ස්ථානයක කෑ ගැසීමේ අරමුණ දැනගන්න කුතූහලයෙන්. අවුරුදු 15 ක වීතර දියණියකට ඇගේ මවයි ඒ දොස් කිව්වෙ. හේතුව තමයි පන්ති යනවා කියලා උදේ ගෙදරින් ඇවිත් ඒ මව කාර්යාලයට යන්න එද්දිත් දියණිය බස් නැවතුමේ රැඳී සිටීම. නමුත් ඒ අම්මා කතා කළේ අවුරුදු 15 ක දියණියකට සුදුසු ලෙස නොවේ. හුතාක් නොසරපස් වදන් ඇගේ කෑගැසීමේ තිබුණා. ඒ දියණිය නිදහසට කරුණු කියන්න කොහෙක් උත්සාහ කළත් ඇයට ඒ සඳහා ඉඩක් ලැබුණේම නැහැ. ඒ අම්මාට අවවාද කරන්නට ගිය වැඩිහිටි මහත්මයෙකුටත් ඉතාම පහත් අයුරින් කතා කළ ඒ අම්මා තමන්ට කාර්යාලයට යාමට ප්‍රමාද වෙන බව පවසමින් බසයක නැගී ගියේ අර දියණියට හවසට ගෙදර වරෙන්කො යයි පවසමින්. ඒ දියණිය සනසන්නට වීතැනට රැස් වූ ඇගේ යෙහෙළියන් මෙන්ම වැඩිහිටි යන් ද උත්සාහ කළත් ඇගේ කසුවළ වළකාලන්නට ඒ කිසිවකු සමත් වුණේ නැහැ. ඇත්ටම ඊට පසුවත් කීප දවසක් අපි ඒ දියණිය පිළිබඳව විපරම් කළත් ඇය ගැන නිශ්චිත තොරතුරක් අපට ලැබුණේ නැහැ. සමහර විට ඒ දියණිය ඇත්තටම තම පෙම්වතා වෙනුවෙන් වීතැන ලත වෙන්න ඇති. නැතිනම් තම යෙහෙළියන් වනතුරු ඔවුන් සමගින් පන්තියට යන්නට බලා ඉන්න ඇති. නමුත් ඒ අම්මා වීතැනදී ක්‍රියා කළ ආකාරය සම්පූර්ණයෙන්ම වැරදි බව කාට වැටහුණත් ඒ අම්මා වටහා ගත්තේ නැහැ. එදා ඒ දියණිය ලප්ජාව නිසා සියදිවි නසාගත්තා නම් හෝ ඒ මානසික පීඩනය මත මානසික රෝගියෙකු වුවා නම්... ඒ තරුණ දේවියට වග කිවයුත්තේ ඇගේ අම්මා ම මිස වෙන කවුරුන්ද..? ලංකාවේ තරුණ මරණ සංඛ්‍යාව සිසුයෙන් ඉහළ යාමට බලපෑ එක් සාධකයක් වුණේ ඔවුන්ගේ ප්‍රශ්න වලට එකම විසඳුම සිය දිවි නසාගැනීම යන සිතිවිල්ලයි. මෙවන් ප්‍රශ්න වලින් දැවෙන යොවුන් වියේ දුවා දරුවන්ට ඔවුන්ගේ මව්පියන්ගෙන් ලැබිය යුත්තේ අදිසීමිත ආදරයක්. එ මෙන්ම ඔවුගේ හැසිරීම් ක්‍රියා කලාපයන් තේරුම් ගැනීමේ ඉවක් ද හැම අම්මා කෙනෙකුටම තිබීම අත්‍යවශ්‍ය දෙයක්.

මේනකා ජයතිලක
රිවර්හිල්ස් ක්වීන්ස්ලන්තය

කෙමෙද කුසුම් සුවඳයි

ශ්‍රී ලංකාවේත් ඔස්ට්‍රේලියාවේත් පැහැදිලිව වෙන් වෙන් වශයෙන් ඒදාහා දැක්වෙන ජීවන රටාව, හැසිරීම හා සංස්කෘතිමය වෙනස් කම් පෙන්වා දෙන කෙමෙදු කුසුම් හිරිමාණය මා දකින්නේ අපට හුරු සම්මත වෙලි හිරිමාණයකින් ඔබ්බට ගිය එකක් ලෙසය. මෙහි හිරිමානය ගිනාල් පුනාන්දු ගේ සංකල්පනයට අණ පෙවූ කැමරා ශිල්පි ශ්‍රීලාල් කවුනායක දාරුෂ උත්සාහය ඉතා සාර්ථක එකක් ලෙස අපට දැකිය හැකි ය. මේ හිරිමාණය අනාගතයේදී ඔහු අතින් තවත් රසබර හිරිමාණ බිහිවන අබවට පෙරගිමිත්තක් ලෙස මට පෙනෙයි. ඔහුගේ පළමු උත්සාහයේදී ම ඔස්ට්‍රේලියාවේ වෙසෙන නළු නිලි පිරිසකටද ඉදිරියට එන්නට ඔග පෑදූ සැඩ් ඉතා පැහැදිලිවම පෙනෙයි. මෙය අප අගේ කොට සැළකිය යුතු ය.
ඔස්ට්‍රේලියාවේ සිට රංගනයෙන් මේ වෙලි හිරිමාණයට දායක වූ සැමදෑ සිය උත්ෂහා මනාව පෙන්වා දුන් බවද සඳහන් කරනු කැමැත්තෙමි. දුලාංජිගේ චරිතයට පණ පෙවූ කුඩා දාරියගේ දක්ෂකම් සමහර දොම්පියන්ගේ දෑසට කඳුළු සංවන්නට සමත් විය. මීනා කුමාරි ගැන විශේෂයෙන් කිව යුතු නොවේ. ඇයගේ දෘසිනි පවා අෂ පෑ හැඟීම් අපේ හදවත් තුලට කා වැදුණි.
සිරිල් ධර්මවර්ධන, රොස්ස් කොඩිප්පිලි, වැනි සිහමාවේත් පුළුවු තිරයේත් රංගශක්තයන් පිරවරාගෙන හිම කළ කෙමෙදු කුසුම් වෙලි හිරිමාණය පිළිබඳව අප සැමි ආඩම්බර විය යුතු ය යන්න මගේ හැඟීමයි.

කෙමෙද කුසුම් නැරඹූ රසිකයෙක්

Classifieds
ලුහුඬු දැන්වීම්

First 25 words - $20.00 .
For each additional word $1.00
පළමු වචන 25 සඳහා ඩොලර් 20.00
අතිරේක වචනයක් ඩොලර් 1.00

Sannasa
PO Box 172 Reservior
VIC 3073 Australia
email: info@sannasa.net

0425 720 932
0422 671 826
03 9796 4241

AUTO CARE

ඔබේ වාහනයේ ඕනෑම අලුත්වැඩියාවක් සඳහා අප අමතන්න
ස්පෝට් ඔන් මොබයිල් මිකැනික්
147 ග්‍රීන්වේල් ඩ්‍රයිව් ග්‍රීන්වේල්
03 9333 4346
0421 285 181

මගේ අදහස

පිළිතුරක් නොවේ

ශාස්ත්‍රපති හැරිස් පරකන්දෙණිය සූරිහු මගේ පැදි පබඳ පිළිබඳව තම අදහස දක්වා ඇති බව දිටිමි. මුලින් ම කිව යුත්තක් ඇත, ධර්ම යන සකු වදන හා බැඳෙන්නේ බන්ධු යන වදන බවය්. එසේ නැත් නම් දර්මබෙන්දු යනුවෙන් පියුව ද වරදක් නොවන්නේ බොහෝ දෙනා මහාප්‍රාණ නැති ව මගේ නම කියන නිසා ය. අනෙක් කිව යුත්ත නම් ප්‍රඥ, බන්ධු වැනි වචන වර නැගෙන්නේ ප්‍රඥහු - ප්‍රඥත්, බඳුධුහු - බන්ධූත් යනුවෙනි. එය ප්‍රඥවෝ , බන්ධුවෝ යනුවෙන් වර නැඟුණු තැන් ශාස්ත්‍රපති තුමන් දක ඇද්දැයි නොදැනිමි.

පෙළපත් නම මුලට ලියා හැඳිනි නම අගට යෙදීම සිංහල රීතියය්. අපේ පෙළපත් නම හැඳි ඇත්තේ 'ගෙ' මුල් කරගෙන ය්. මම විදාන කංකානමලාගේ ධර්මබන්ධු වෙමි. වෙදගේ, ගුරුගේ, කොළඹගේ, ගාල්ලගේ යනුත් එබඳු පෙළපත් නාමය්. ඒවාත් අපට යොදා වහර තරනු දක ඇත්තෙමි. ශාස්ත්‍රපති තුමන්ගේ නමත් එවැන්නකි. එතුමා ගේ නම පරකන්දෙණියගේ හැරිස් විය හැකි ය. පරකන්දෙණියෝ - පරකන්දෙණියනු යනුවෙන් පෙළපත් නම් වර තැගන සිරිතක් නැත. හැරිස්සෝ - හැරිසනු යනුවෙන් ලියූ විට ද කිසි ලකයක් නැත. එහෙයින් මා දන්නා හොඳම විදියට එතුමන් හඳුන්වමි.

මගේ මතයට අනුව මම ඒ පබඳ කළෙමි.

ශාස්ත්‍රපති තුමෝ තම මතය ඉදිරිපත් කරති. කවරුන් හරි දැයි දැන්නා එකම එක්කනා ඇත්තක් කීවත් බොරුවක් කීවත් අප බාර ගත යුතු ය. ඔබ ඇයට සුදු හුණු ගාන්නට යන්නේ කවර හෙය්න් දැයි නොදැනිමි. මම කිසිදාක මගේ දරුවකු ගැනවත් එබඳු සහතිකයක් නොදෙමි, සමහර විට එය හතර හිනාවෙන් එකක් වීමට බැරි නැත. සැමියාගේ ඇස් වසා කටයුතු කරන බිරියෝත් බිරියගේ ඇස් වසා කටයුතු කරන සැමියෝත් සිටින් ල.

රේගු නිලධාරීන්ට කොටු නොවී රට තුළට යැමට කෝබින් සමත් වුනු නම් ඇයට ගංජා පොදියක් (මත් කුඩු නොවේ) දකින්ට ලැබුණු විට,

හානේ මේ මොනාද? (ළඟ සිටින කෙනෙකුගෙන්) ඇහුණද මෙයා... මේ අර සෙනෙහෙ කොළ කියන ජාතියද...? අපරාදෙ කාගෙද මල්ලක් මගේ පස්යට ඇවිත්නේ..(පය්ය හොඳ සිංහල වදනකි.. කොකකම පය්ය, බුලත් පය්ය මෙනි) මාත් හරියට දන්නෑ.. මේ වා නං ඉස් කොළ වගේ.. එයා ආයුර්වේද බෙහෙක් හදන්න ගෙනියන එකක් වෙන්ටෑ

වැනි සංවාදයක් ඇතිවී අනතුරුව ගංජා පොදිය බින්නට (Bin) බිලිවනු ඇත. නැතහොත් කෝබි එහි පොලිසියට පැමිණිල්ලක් කොට ගංජා පොදිය පොලිසියට බාර දෙනු ඇත.

ඕස්ට්‍රේලියාවේ වැසියෝ ගංජා මත් කුඩු නොහඳුනති. මත්ද්‍රව්‍ය හා සම්බන්ධ වැරදි වලට හසු වන්නෝ මේ රටේ නොවෙති. ලිංගික අපචාර පිළිබඳ වැරදි වලට හසු වන්නෝ ද නොවෙති. සැමියා නිවාසු යවා පුතා සමග පවුල් කන අම්මා කෙනෙකු ගැන රූපවාහිණියේ අතුරුදැක්ම (interview) පිට රටක සිද්ධියක් විය යුතුය.

මේ හේතු නිසා කෝබි වැනි අභිංසක තරුණ ලඳකට අසත්‍ය පදනමක් මත නඩු පවරා ඇයට දඬුවම් කළ අයට හොඳක් නොවාමැති ඇත.
ලන්ඩනය පිපිරවූ හුසේන් හනුමා වුවද පොලිසියට හසු වීණි නම් අනේ දෙය්යම්පල්ල මං නං හාංකවිසියක් දන්නං යි කියනු ඇත.

කිසිදාක අවඩාධියිබෝ වේවා ය් කියවා ගන්නට අත ගහ මැතිරීමක් කරවා ගෙන නැති මම එතුමන්ගේ Good on him ප්‍රාර්ථනය කෘතඥතා පූර්වකව පිළිගනිමි.

එතුමන් ඉදිරිපත් කළ වාං මාලාව ගැන යමක් කීමට මට හැකියාවක් නැත. මට ඇත්තේ ඉප්පත් ඉංගිරිසි දැනුමකි. එහෙත් surf යනු පෙණ බව සැබෑ වුවත් surfing යනු පෙණ වලට සම්බන්ධයක් නැති, පුවරුවක නැඟී රළ මතින් වෙරළ දෙසට ඊමේ දිය කෙළියකි. එහෙයින් පෙණ ඉපිළුම් පෙණපිළුම් යන්න ඒ සඳහා කොතරම් දුරට ගැලපේ දැයි යළි සලකා බලන මෙන් ඉල්ලමි.

Surfing, Surf Boad යන ඉංගිරිසි පද වෙනුවට සිංහල පද යෙදීමට අවශ්‍ය වූ විටෙක රළ කෙළිය, රළ කෙළි පුවරුව වැනි පද මට ලියවෙතැයි සිතමි. මම එතුමන්ට සිංහල ක්‍රමයට (ආ - ඉ - බෝ - වන්) ආර්ගෝව්වන් කියමි

වී. ක. ධර්මබන්ධු

Visiting Tutor
Are you looking for a tutor in mathematics and accounting for your child. Look no further, I am much experienced and qualified in accounts and finance. I am an excellence academic scholarship winner from La Trobe University.
For students from year 4 to VCE and 1st year Uni.
Contact me
Sanjeewa Pothupitiyage
Mobile 0422 138 892
Tel : 03 9460 2408

Kandy Lube
All Mechanical Repairs
03 9462 2199